www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ පොලීසිය ජවිපෙ මාධ්‍යවේදීන් තිදෙනෙක් අත්අඩංගුවට ගනියි

**Sri Lankan police detain three JVP journalists**

ඩබ්ලිව්.ඒ. සුනිල් විසිනි

2009 සැප්තැම්බර් 08

ජනතා විමුක්ති පෙරමුන විසින් පල කරනු ලබන ලංකා පත්‍රයේ මාධ්‍යවේදීන් තිදෙනෙකු මෑග හදිසි නීති යටතේ පොලිසිය විසින් අත් අඩංගුවට ගෙන ඇත. වධදීම් මගින් පාපොච්චාරන ලබා ගැනීම සම්බන්ධයෙන් කුප්‍රකට ත්‍රස්තවාදී විමර්ශන ඒකකය විසින් මාධ්‍යවේදීන් තිදෙනා රඳවා ගෙන සිටිති.

අත් අඩංගුවට ගැනීම සිදු වූයේ සැප්තැම්බර් 2 ශ්‍රේෂ්ඨාධිකරනය විසින් දෙමල මාධ්‍යවේදී ජේ.එස් තිස්සනායගම්ට බරපතල වැඩ සහිතව විසි අවුරුදු සිර දඬුවමක් නියම කර හරියට ම දෙදිනකට පසුව ය. ඔහුට විරුද්ධව චෝදනා ගොනු කරනු ලැබුවේ මැයි මාසයේ දෙමල විමුක්ති කොටි සංවිධානය හමුදාව විසින් පරාජයට පත් කිරීමෙන් පසුවත් පවත්වාගෙන යන හදිසි නීති සහ ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ ය.

මෙම නවතම අත් අඩංගුවට ගැනීම ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්ට එල්ල කරන ප්‍රහාරයේ කොටසකි. සිංහල අන්තවාදය සහ ජනතාවාදී වාචාල කතා මත පදනම් වී සිටින පක්ෂයක් වන ජවිපෙ එල්ටීටීඊ ය ට රුදුරු ලෙස විරුද්ධ වූයේ ය. 2005 ජනාධිපතිවරනයේ දී මහින්ද රාජපක්ෂ බලයට ගෙන ඒම සඳහා උද්ඝෝෂනය කල ඔවුහු, ඔහුගේ වර්ගවාදී යුද්ධයට මුලුමනින් ම සහයෝගය දුන්හ.

එහෙත්, ජවිපෙ පාර්ලිමේන්තුව තුල විපක්ෂයේ සිටිමින් ආන්ඩුවේ දූෂන සහ නාස්තිය ගැන සීමිත විවේචන කලේ ය. ලංකා පත්‍රය ඉලක්ක කර ගැනීම මගින් රාජපක්ෂ තන්ත්‍රය විසින් පැහැදිලි කරනු ලැබ ඇත්තේ එය කිසිදු දේශපාලන විරුද්ධත්වයක් නො ඉවසන බවය.

මාධ්‍යවේදීන් තිදෙනා - ලංකා පත්‍රයේ කර්තෘ මන්ඩල සාමාජික ශාලිත පුෂ්පකුමාර, ප්‍රාදේශීය වාර්තාකරු දයා නෙත්තසිංහ සහ ඡායාරූප ශිල්පි රවින්ද්‍ර පුෂ්පකුමාර - අත් අඩංගුවට ගනු ලැබුවේ මාතර දෙනියායේ දී ය. ඔවුන් අත් අඩංගුවට ගත්තේ මහින්ද රාජපක්ෂගේ ඥාතියෙකුට අයිති වත්තක නිවසක් ගොඩනැගීම සඳහා රාජ්‍ය සම්පත් යොදා ගන්නා බවට ලැබුන තොරතුරක් ගැන විස්තර සොයා බැලීමක යෙදී සිටිය දී බව ලංකා පත්‍රයේ කර්තෘ චන්දන සිරිමල්වත්ත *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* පැවසුවේ ය.

පොලීසිය ඔවුන්ගේ කැමරා, ජංගම දුරකථන සහ ඔවුන් ගමන් කල ත්‍රීරෝද රථය ද අත් අඩංගුවට ගත්තේ ය. පලමුව ඔවුන්ව දෙනියාය පොලීසියට ගෙන ගොස් පසුව කොලඹ ත්‍රස්ත විමර්ශන ඒකකයට මාරු කලහ.

පොලිස් මාධ්‍ය ප්‍රකාශක නිමල් මැදිවක විසින් නිකුත් කල මාධ්‍ය ප්‍රකාශයක මෙසේ සඳහන් කර ඇත: "ජනාධිපති සහ ආරක්ෂක ලේකම් ඝාතනය කිරීමේ එල්ටීටීඊ කුමන්ත්‍රන ගැන පරීක්ෂන පැවැත්වීමේ දී සිංහල ජාතිකයන් ද ඊට සම්බන්ධ බව පසුව දැනගැනීමට ලැබුන හෙයින් මෙම අත් අඩංගුවට ගැනීම අත්‍යවශ්‍ය කරනු ලබයි. මාධ්‍යවේදීන්ගේ හැසිරීම අතිශයින්ම සැක උපදවන හෙයින් පොලීසියට ඒ සම්බන්ධව පියවරක් ගැනීමට සිදු විය. මේ සම්බන්ධයෙන් දැන් පරීක්ෂනයක් පැවැත්වෙමින් තිබේ."

ලංකා පත්‍රයේ කර්තෘ චන්දන සිරිමල්වත්ත ඉරිදා ත්‍රස්ත විමර්ශන ඒකකයට කැඳවා පැය තුනක් ඔහුගෙන් ප්‍රශ්න කර ඇත. මාධ්‍යවේදීන් දෙනියායට යැව්වේ ඇයි සහ ජනාධිපති ඝාතන කුමන්ත්‍රනය ගැන දන්නේ දැයි ඔහුගෙන් විමසූ බව ඔහු කීවේ ය. මග නැගුම ගැන ඔහු සොයාගත් තොරතුරු මොනවා ද සහ සොයා ගන්නා තොරතුරු වෙනත් ආයතනවලට විකුනන්නේ දැයි තව දුරටත් අසා ඇත. මාර්ග ව්‍යාපෘතිය ජනාධිපති රාජපක්ෂගේ මවාපෑමක් නමුත් එමගින් කෙරෙන දූෂන පිලිබඳව බෙහෙවින් චෝදනා එල්ල වී තිබේ. ජනාධිපති ඝාතන කුමන්ත්‍රනයක් පිලිබඳව තමන් කිසිවක් නොදන්නා බවත් එවැන්නකට කිසිදු සම්බන්ධයක් නැති බවත් සිරිමල්වත්ත ප්‍රකාශ කර ඇත.

ත්‍රස්ත විමර්ශන ඒකකයේ නිලධාරීන් සඳුදා ලංකා පත්‍රයේ කාර්යාලයට ද පැමින නියෝජ්‍ය කර්තෘ අසංක සහ සහකාර කර්තෘන් වන බන්දුල ගුනරත්න සහ ආරියසේන මනමේන්ද්‍රගෙන් ද ප්‍රශ්න කර තිබේ.

ජවිපෙ මාධ්‍යවේදීන් අත් අඩංගුවට ගැනීම ආන්ඩුව "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" තමන්ට එරෙහි කවර හෝ විරුද්ධ පාර්ශ්වයක් බිය ගැන්වීමට සහ නිහඬ කිරීමට යොදා ගන්නා බවට පැහැදිලි උදාහරනයකි.

ආන්ඩුවේ ආරක්ෂක හමුදාවන්ගේ අනුදැනුම ඇතිව ක්‍රියාත්මක වන ඝාතක කල්ලි මාධ්‍යවේදීන් සහ මාධ්‍ය සේවකයන් පැහැර ගෙන යාම, පහරදීම, සහ ඝාතනය කිරීම කර තිබේ.

ඔහුගේ පවුලට සහ සමීප සගයන්ට විරුද්ධ දූෂන චෝදනා සම්බන්ධයෙන් ජනාධිපති රාජපක්ෂ විශේෂයෙන් ම සංවේදී ය.

යුක්රේනයෙන් මිග් 27 ප්‍රහාරක යානා මිල දී ගැනීමේ විශාල ගුවන් හමුදා කොන්ත්‍රාත්තුවක දී සිදුවූ දූෂන එලිදරව් කරමින් 2007 දී ලිපි කීපයක් ලිවීමෙන් පසු *සන්ඩේ ටයිම්ස්* පත්‍රයේ ආරක්ෂක ලියුම්කරු ඉක්බාල් අතාස් නිහඬ කිරීමේ දඬයමක් දියත් කලේ ය. රුසියාවේ සහ යුක්රේනයේ ශ්‍රී ලංකා තානාපති, ජනාධිපති රාජපක්ෂගේ ඥාති සහෝදරයකු වන උදයන්ත වීරතුංග ගනුදෙනුවට සම්බන්ධ විය. එහි සම්පූර්න දේශපාලන වගකීම පැටවුනේ ඔහුගේ සොහොයුරු ගෝඨාභය රාජපක්ෂ සහ ආරක්ෂක ඇමති ද වන ජනාධිපති පිට ය.

අත්අඩංගුවට ගැනීම ජවිපෙ ඉදිරියේ දේශපාලන උභතෝකෝටිකයක් මතු කර තිබේ. ආන්ඩුව "සෘජු, සැඟවුනු සහ ඉතා දරුනු පියවර" මගින් ඇත්ත ලියන මාධ්‍යවේදීන්ට මුකවාඩම් දැමීමට තීන්දු කර තිබෙන බව ජවිපෙ පාර්ලිමේන්තු කන්ඩායමේ නායක අනුර කුමාර දිසානායක ඉරිදා පැවැති ප්‍රවෘත්ති සාකච්ඡාවක දී ප්‍රකාශ කලේ ය. ආන්ඩුව " ෆැසිස්ට්වාදයට සහ අරාජකත්වයට" ගමන් කරමින් තිබෙන බවට ද ඔහු චෝදනා කලේ ය.

එහෙත් ඒ සමග ම, පාර්ලිමේන්තුවේ දී පක්ෂය හදිසිනීතියට දිගටම ඡන්දය දෙනවාදැයි ඉදිරියේ දී තීන්දු කල යුතු බව දිසානායක කීවේ ය. යුද්ධයට සහයෝගය දීමේ කොටසක් ලෙස ජවිපෙ සෑම මාසයකදී ම මෙම ප්‍රජාතන්ත්‍ර විරෝධී පියවරයන්ට පක්ෂව ඡන්දය දුන්නේ ය. දහස් ගනනක් දෙමල ජනයා "එල්ටීටීඊ සැකකරුවන්" ලෙස නඩු විභාගයකින් තොරව රඳවා තැබීමට මෙම නීති උපයෝගි කර ගෙන ඇත.

ඔවුන්ගේ හිත පක්ෂපාතී සහයෝගයේ පදනම මත ජවිපෙ සහ ලංකා පත්‍රය රාජපක්ෂට ආයාචනය කරති. "ඔහුව පරාජය කිරීම සහ වැට්ටවීමට ඔහුගේ පක්ෂයේ ම සමහරුන් උත්සාහ කරමින් සිටි අවස්ථාවක" 2005 දී ඔහුගේ ජනාධිපතිකම ලබා ගැනීමට සහයෝගය ගොනු කිරීම සඳහා ලංකා පත්‍රය උද්ඝෝෂනය කල බව එහි කර්තෘ සිරිමල්වත්ත දක්ෂිනාංශික ද අයිලන්ඩ් පත්‍රයට ප්‍රකාශ කලේ ය.

යුද්ධයට විරුද්ධවනවා වෙනුවට 2002 සටන් විරාමය බිඳ දැමීමට සහ 2006 මැද යලි යුද්ධය ආරම්භ කිරීමට රාජපක්ෂ තල්ලු කිරීම ගැන ජවිපෙ වහසිබස් දොඩයි. යුද්ධයේ විවේචකයන් "එල්ටීටීඊ සහකරුවන්" ලෙස හංවඩුගැසූ ආන්ඩුවේ ප්‍රකාශකයන් දෝංකාර නැගුවා මිස ආන්ඩුව විසින් පීඩාවට පත් කල සෙසු මාධ්‍යවේදීන්ගේ ජවිපෙ විසින් අයිතීන් ආරක්ෂා කර නැත. ඒ වෙනුවට යුද අපරාධ සහ මානව අයිතීන් උල්ලංඝනය කිරීම පිලිබඳ ජාත්‍යන්තර විවේචනයන්ට විරුද්ධව ජවිපෙ ආන්ඩුව ආරක්ෂා කලේ ය.

පාර්ලිමේන්තුවේ දී ආන්ඩුවේ අයවැයට සහ එහි දැවැන්ත ආරක්ෂක වියදම්වලට ජවිපෙ ඡන්දය දී ඇති නමුත් යුද්ධය සහ ගැඹුරුවන සමාජ අර්බුදය කෙරෙහි මහජන අතෘප්තිය නැගීම මධ්‍යයේ දී එය විපක්ෂයේ අසුන්ගෙන සිටියි. පසුගිය වසරේ ජවිපෙ පාර්ලිමේන්තු කන්ඩායමේ නායක විමල් වීරවංශ ඇතුලු මන්ත්‍රීවරු 10ක් පක්ෂයෙන් වෙන් වී ජාතික නිදහස් පෙරමුන ගොඩනගා ආන්ඩුවට එකතු වූ විට එහි පාර්ලිමේන්තු සාමාජිකයන් තුල කැරැල්ලක් ඇති විය.

බොරු චෝදනා මත ලංකා පත්‍රයේ මාධ්‍යවේදීන් අත්අඩංගුවට ගැනීම කම්කරු පන්තියට තවත් තියුනු අනතුරු ඇඟවීමකි. එහි පැරනි දේශපාලන සගයන් සම්බන්ධයෙන් ආන්ඩුව එබඳු ක්‍රම යොදා ගන්නේ නම් තම ජීවන තත්ත්වයන් සහ මූලික අයිතීන් රැක ගැනීම සඳහා සටන් කරන කම්කරුවන්ට, ගොවීන්ට, සහ තරුන ජනයාට එරෙහිව ඊට වඩා දරුනු ක්‍රම යොදා ගනු ඇත.

රාජපක්ෂගේ දැවැන්ත යුද වියදම් මගින් අර්බුදයක් නිර්මානය කර ඇති ආර්ථිකය ලෝක ආර්ථික පසුබෑස්මේ ප්‍රතිපලයක් ලෙස තව දුරටත් නරක අතට හැරී තිබේ. එල්ටීටීඊය පරාජය කිරීමෙන් පසුව "ජාතිය ගොඩනැගීමේ" නව "ආර්ථික යුද්ධයක්" ප්‍රකාශයට පත් කල ජනාධිපති, සොල්දාදුවන් පරිත්‍යාග කල ආකාරයට වැඩ කරන ජනයා ද පරිත්‍යාග කල යුතු යයි ඉල්ලා සිටියේ ය. දෙමල ජනයාට එරෙහිව යොදාගත් පොලිස්-රාජ්‍ය පියවරයන් ම සමස්ථයක් ලෙස කම්කරු පන්තියට විරුද්ධව යොදා ගනු ඇත.

©
www.wsws.org